01
පාඩම
प्रथमः पाठः

# අක්ෂර හඳුනා ගනිමු

## අක්ෂර

*භාෂාවක කතා කිරීමට යොදා ගන්නා වචන ලියා තැබීම සඳහා භාවිත කෙරෙන සංකේත අක්ෂර නම් වේ. ලෝකයේ විවිධ භාෂා විශාල සංඛ්‍යාවක් ඇති අතර ඒවා ලියා තැබීමට ඇතැම් භාෂාවන්ට වෙන් වූ අක්ෂර රූප ඇත. සංස්කෘත භාෂාවට ද වෙන් වූ අක්ෂර මාලාවක් හා එම අක්ෂර ලියා දැක්වීමට වෙන් වූ සංකේත රූප මාලාවක් ද ඇත. එම සංස්කෘත භාෂාව ලියන අක්ෂර දේවනාගරී අක්ෂර නමින් හැඳින්වේ. දැනටමත් ඔබ පළමු ශ්‍රේණියේ දී දේවනාගරී අක්ෂර උගෙන ඇති අතර මෙම ශ්‍රේණියේ දී ඒවා පිළිබඳ වැඩි දුරටත් විස්තරාත්මක ව උගනිමු.*

## 1. දේවනාගරී අක්ෂර මාලාව

සංස්කෘත භාෂාවේ දේවනාගරී අක්ෂර පිළිබඳ මීට පෙර වසරේ දී ද ඔබ උගෙන ඇත. එහි දී ස්වර, ව්‍යඤ්ජන, පිලි භාවිතය ආදිය පිළිබඳ උගෙන ඇති අතර එම කරුණු නැවත සිහිපත් කර ගනිමු. ස්වර අක්ෂර (14) **දහතරකින්** හා ව්‍යඤ්ජන අක්ෂර (35) **තිස්පහකින්** ද සමන්විත දේවනාගරී අක්ෂර මාලාව මෙසේ ය.

ස්වර - 14

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| अ | आ | इ | ई | उ | ऊ | ऋ |
| ॠ | ऌ | ॡ | ए | ऐ | ओ | औ |

ව්‍යඤ්ජන - 35

| | | | | |
|---|---|---|---|---|
| क | ख | ग | घ | ङ |
| च | छ | ज | झ | ञ |
| ट | ठ | ड | ढ | ण |
| त | थ | द | ध | न |
| प | फ | ब | भ | म |
| य | र | ल | व | |
| श | ष | स | ह | |
| अं | अः | | | |

**පිලි භාවිතය**

| ව්‍යඤ්ජන අක්ෂර | ස්වර අක්ෂර | යෙදෙන පිල්ල | පිල්ල සහිත අක්ෂර |
|---|---|---|---|
| क् | अ | – | क |
| क् | आ | ा | का |
| क् | इ | ि | कि |
| क् | ई | ी | की |
| क् | उ | ु | कु |
| क् | ऊ | ू | कू |
| क् | ऋ | ृ | कृ |
| क् | ॠ | ॄ | कॄ |
| क् | ऌ | ॢ | कॢ |
| क् | ॡ | ॣ | कॣ |
| क् | ए | े | के |
| क् | ऐ | ै | कै |
| क् | ओ | ो | को |
| क् | औ | ौ | कौ |


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

| ස්වර | | පිලි | | | පිලි යෙදුණු වචන | |
|---|---|---|---|---|---|---|
| සිං: | සංස්: | සිංහල | සංස්: | පිලි යෙදීම | ස්වර ආරෝපණය වන අයුරු | වචන |
| අ | अ | - | - | क | क् + अ - क | कमल |
| ආ | आ | ා - ඇලපිල්ල | ा | का | क् + आ - का | कासार |
| ඉ | इ | ි - ඉස්පිල්ල | ि | कि | क् + इ - कि | किरण |
| ඊ | ई | ී - දීර්ඝ ඉස්පිල්ල | ी | की | क् + ई - की | कीटक |
| උ | उ | ු / ු - පාපිල්ල | ु | कु | क् + उ - कु | कुटीर |
| ඌ | ऊ | ූ / ූ - දීර්ඝ පාපිල්ල | ू | कू | क् + ऊ - कू | कूप |
| ඍ | ऋ | ෘ - ගැටය සහිත ඇලපිල්ල | ृ | कृ | क् + ऋ - कृ | कृपण |
| ඎ | ॠ | ෲ - ගැටය සහිත ඇලපිලි දෙක | ॄ | कॄ | क् + ॠ - कॄ | कॄकार |
| එ | ए | ෙ - කොම්බුව | े | के | क् + ए - के | केदार |
| ඓ | ऐ | ෛ - කොම්බු දෙක | ै | कै | क् + ऐ - कै | कैलास |
| ඔ | ओ | ෙ ා - කොම්බුව සහ ඇලපිල්ල | ो | को | क् + ओ - को | कोटर |
| ඖ | औ | ෙ ෟ - කොම්බුව සහ ගයනුකිත්ත | ौ | कौ | क् + औ - कौ | कौशिक |

## 1.1 අභ්‍යාසය

1. පහත සඳහන් හිස්තැන් සඳහා අදාළ සිංහල අක්ෂරය ලියන්න. මෙහි දී අභිමත වර්ණ භාවිත කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| अ..... | ऊ..... | ए..... | आ..... | ऋ..... |
| ऐ..... | इ..... | ॠ..... | ओ..... | ई ..... |
| ऌ..... | औ..... | उ..... | ॡ..... | |

2. පහත සඳහන් හිස්තැන්වලට අදාළ අක්ෂරය ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| क | ..... | ग | ..... | ङ |
| ..... | छ | ..... | झ | ..... |
| ट | ..... | ड | ..... | ण |
| ..... | थ | ..... | ध | ..... |
| प | ..... | ..... | ..... | म |
| ..... | र | ल | ..... | |
| श | ..... | स | ..... | |
| ..... | अः | | | |

3. පහත දැක්වෙන හ්‍රස්ව ස්වර නාගරී අකුරින් ලියා ඒවායේ දීර්ඝ සවර ලියන්න.

| | |
|---|---|
| අ → ................ | ඉ → ................ |
| උ → ................ | ඍ → ................ |
| ඏ → ................ | |

4. මේවා දේවනාගරී අක්ෂර භාවිත කරමින් ලියන්න (අභිමත වර්ණ භාවිත කරන්න).

| | | | | |
|---|---|---|---|---|
| ක ........ | ඛ ........ | ග ........ | ඝ ........ | ඞ ........ |
| ච ........ | ඡ ........ | ජ ........ | ඣ ........ | ඤ ........ |
| ට ........ | ඨ ........ | ඩ ........ | ඪ ........ | ණ ........ |
| ත ........ | ථ ........ | ද ........ | ධ ........ | න ........ |
| ප ........ | ඵ ........ | බ ........ | භ ........ | ම ........ |
| ය ........ | ර ........ | ල ........ | ව ........ | |
| ශ ........ | ෂ ........ | ස ........ | හ ........ | |
| අං ........ | අඃ ........ | | | |

## 1.2 අභ්‍යාසය

1. ව්‍යඤ්ජනයන්ට ස්වර ආරෝපණය වූ විට යෙදෙන නිවැරදි පිලි සහිත අකුරු ලියන්න

| | | | | |
|---|---|---|---|---|
| 1. | ग् | + | अ | ............ |
| 2. | च् | + | ई | ............ |
| 3. | ट् | + | उ | ............ |
| 4. | त् | + | इ | ............ |
| 5. | र् | + | ऊ | ............ |
| 6. | ध् | + | ऋ | ............ |
| 7. | ल् | + | ए | ............ |
| 8. | न् | + | ॠ | ............ |
| 9. | म् | + | ऐ | ............ |
| 10. | ब् | + | ओ | ............ |
| 11. | स् | + | औ | ............ |

2. පළමු පේළියේ සඳහන් පිලි සහිත අකුරෙන් නියෝජනය වන නිවැරදි ස්වරය දෙවන පේළියෙන් තෝරා යා කරන්න

| | පළමු පේළිය | දෙවන පේළිය |
|---|---|---|
| 1. | दा | ऐ |
| 2. | रो | ऋ |
| 3. | गृ | ई |
| 4. | थै | औ |
| 5. | टी | आ |
| 6. | तृ | ए |
| 7. | शो | ॠ |
| 8. | पि | इ |
| 9. | कौ | ओ |

## 1.3 අභ්‍යාසය

1. පහත සඳහන් වචන සිංහල අකුරින් ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1. **नयन** । | (ඇස) | 2. **चिबुक** । | (නිකට) |
| 3. **नासिका** । | (නාසය) | 4. **ऊरु** । | (කලවා) |
| 5. **शरीर** । | (ශරීරය) | 6. **मुख** । | (මුඛය) |
| 7. **पाद** । | (පාදය) | 8. **हृदय** । | (හදවත) |
| 9. **उदर** । | (බඩ) | 10. **लोम** । | (ලොම්) |

2. පහත දැක්වෙන වචන දේවනාගරී අකුරින් ලියන්න.

| | |
|---|---|
| 01. තාලු (තල්ල) | 02. ශ්‍රෝත (කණ) |
| 03. ඕෂ්ඨ (තොල්) | 04. දන්ත (දත්) |
| 05. හස්ත (අත) | 06. මනස් (මනස) |
| 07. ජිහ්වා (දිව) | 08. කණ්ඨ (බොටුව) |
| 09. අඞ්ක (උකුළ) | 10. කේශ (කෙස්) |
| 11. නඛ (නිය) | 12. අංගුෂ්ඨ (මාපට ඇඟිල්ල) |
| 13. මාංස (මස්) | 14. වංශ (කොඳු ඇටය) |

### භාවිතයට

**नमः समन्तभद्राय - सर्वगोचरचक्षुषे ।**
**करुणामृतकल्लोल - सिन्धवे सूर्यबन्धवे ॥**

සියල්ල ගොදුරු වන ඇස් ඇති, කරුණාව නමැති අමා රළපෙළට මුහුදක් බඳු වූ, සූර්ය වංශයට ඥාති වූ, සැමතින් ම යහපත් වූ බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා!